**2025-12-11 බළන්ගොඩ ප්‍රාදේශීය සභා**
**මාසික මහා සභා රැස්වීමේ**
**සංක්ෂිප්ත වාර්තාව**

2025 දෙසැම්බර් මස 11 වන දින බළන්ගොඩ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පවත්වන ලද මාසික මහා සභා රැස්වීමේ සංක්ෂිප්ත වාර්තාවයි.

**සහභාගිත්වය :**

1. ගරු සභාපති - ගමඇතිගේ ආරියදාස මැතිතුමා
2. ගරු උපසභාපති - බී.එල්.ඒ.ධනුෂ්ක නන්දසිරි මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.බී.ගුණරත්න මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - බී.ඩබ්.තුෂාර කුමාර මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.රෝහණ ජගත් වීරසේකර මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - යූ.ඉන්දික කරුණාරත්න මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - අයි.සමන් කුමාර මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.නිශාන්ත කිත්සිරි මැතිතුමා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - මුදිත ප්‍රසාද් මල්ලිකාරත්න මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.පී.එම්.සනත් ධර්මරාජ මැතිතුමා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.එම්.ඩබ්.ලක්රුවනි සමරනායක මැතිනිය
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එල්.ඩී.ඩී.ජයශීලි ලියනගේ මැතිනිය
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.කේ.අජිත් ප්‍රියන්ත මැතිතුමා
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.බී.එන්.දීපශිකා පෙරේරා මැතිනිය
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.එම්.ආර්.නයනජිත් හේමාල් මැතිතුමා
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - අයි.එල්.පී.කුමාර ගුණසිරි මැතිතුමා
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ඩබ්.දර්මදාස මැතිතුමා
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.කේ.ඩබ්.ජගත් නිලන්ත කුමාර මැතිතුමා
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පූජ්‍ය බෝවත්තේ ධම්මාරාම හිමි
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඊ.එම්.ආර්.මලිත් ජයසේන මැතිතුමා
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.කේ.එම්.ඉක්බාර් මැතිතුමා
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.එම්.වජිරා ගීතානි වීරසේන මැතිනිය
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - බී.ඩබ්.පී.චන්ද්‍රාණි නන්දරත්න මැතිනිය
24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.එම්.ශ්‍රියානි මැතිනිය
25. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.කේ.ඩී.රෝෂන් ක්‍රිස්ටි මැතිතුමා
26. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.අසෝක්කුමාර් මැතිතුමා
27. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.එන්.විමලසේන දිසානායක මැතිතුමා
28. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඩී.ඉදුනිල් ප්‍රියන්ත මැතිතුමා
29. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඩබ්.අනුර ක්‍රිෂාන්ත් බස්නායක මැතිතුමා
30. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - යූ.රෝහණ පුෂ්පකුමාර මැතිතුමා
31. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.ටී.කුසුම්සිරි අලංකාර මැතිතුමා
32. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එල්.කේ.දහම් ගුණසේකර මැතිතුමා
33. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.ජී.දනුෂ්ක සමන්ත කුමාර මැතිතුමා
34. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.සී.ඉන්ද්‍රානි ගුණසිංහ මැතිනිය
35. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ජී.පී.නිලන්ති වීරවංශ මැතිනිය

**සහභාගි නොවූ :**

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.යූ.සී.තිලක් වික්‍රමසිංහ මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.නන්දසිරි මැතිතුමා

**01.පසුගිය සභා වාර්තාව සම්මත කිරීම**

**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**

අපිට න්‍යාය පත්‍රයේ මුලින්ම තියෙන්නේ පසුගිය නොවැම්බර් මස සභා වාර්තාව සහ විශේෂ මහා සභාවේ වාර්තාව සම්මත කිරීම. ගරු මන්ත්‍රීතුමෙක් හෝ තුමියෙක් ඉදිරිපත් වෙලා එම වාර්තා දෙක සභා සම්මත කරන්න කියලා මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම්.ආර්.මලිත් ජයසේන මැතිතුමා**

ගරු සභාපතිතුමා ගියවර අයවැය කෙටුම්පත් ඉදිරිපත් කිරීමේදී මා හට පැන නැගුණු ශීර්ෂ 03ක් පිළිබඳව මම විමසීමක් කළා. එහිදී කාරක සභාවක් පත් කරලා එම ශීර්ෂ 03 ගැන සාකච්ඡා කරලා අපිට ඒ අවබෝධය ලබා දීලා ඒක ඒ අකාරයට සටහන් කරන්න කියලා අපි තීරණය කළා. නමුත් ඒ ශීර්ෂ 03 මොනවද කියලා වාර්තාවේ සඳහන් වෙලා නැහැ. මොකද යම් කිසි කාලයක් යද්දි ඒ අපිටත් මතක නැති වෙයි කතා කළේ මොනවද කියලා. මෙතන ඉන්න මන්ත්‍රීවරුන්ට දැන ගන්නත් එක්ක ඒක වාර්තාවේ සටහන් වෙන එක සුදුසුයි කියලා මම හිතනවා. අනික ගරු සභාපතිතුමා පොඩි ප්‍රශ්නයක් තියෙනවා ගියවර අයවැය කෙටුම්පත සකස් කිරීමේ රැස්වීමේදී මහා සභාවේ දිනය වෙනස් කරලා තිබුණා ඊට කලින් දවසට අරගෙන. එතකොට ගරු සභාපතිතුමා අපි දැන් 2026 වර්ෂයේත් මහා සභාව පවත්වන දින සඳහා සභාවේ අනුමත කරගෙන ස්ථිර කර ගන්න ඕනි. එලෙස යෝජනාව ස්ථිර කර ගත්තහම එම දිනය විශේෂ මහා සභාවකින් වෙනස් කරන්න ඕනි කියලා තමයි සාමාන්‍යය විදියට අපි දන්නේ. එතකොට අයවැය කෙටුම්පත සකස් කිරීමට පෙර ඒකාබද්ධ කාරක සභාව කියලා එකක් තිබ්බා. එතන අයවැය කොටුම්පත ගැන කරුණු කාරණා ඉදිරිපත් කරලා තිබුණා. ඊට පස්සේ නැවත 2025-11-04 විශේෂ මහා සභාව රැස් කරලා තිබ්බා. අපි දන්නවා විශේෂ මහා සභාවක් රැස් කරන කොට ඒ සභාවේ කතා කරන්න අවශ්‍ය කාරණා පිළිබඳව අපිට කලින් දැනුම් දීලා එවනවා. එතකොට ඒ තියෙන කරුණු ගැන විතරයි අපි කතා කරන්නේ. එතකොට එතනදි දින වෙනස් වීම පිළිබඳ සාකච්ඡා වෙලා නැහැ. ඒ නිසා අපි ඉදිරි වර්ෂය සඳහා ගනුදෙණු කිරීමේදී, එහෙම නැත්තම් වැඩ කරන කොට නීත්‍යානුකූල නොවන දිනයක් දාගත්ත සභාවක වාර්තාව පිළිබඳවත් ගැටලුවක් මතු වෙනවා. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා මේ සම්බන්ධව ඔබතුමාට උපදෙසක් ගන්න කියලා. ඒ වගේම අපේ මේ මන්ත්‍රීවරුන්ට ප්‍රශ්නයක් වෙලා තියෙනවා එදා අයවැය ඉදිරිපත් කිරීම ගැන. ඇත්තටම හැමෝම කියනවා අයවැය ඉදිරිපත් කිරීම ගැන කිසිම දැනීමක් , හැඟීමක් ආවේ නැහැ කියලා. සාමාන්‍යයෙන් අයවැය අපි ඉදිරි වර්ෂයට ඉදිරිපත් කළාට අපේ ගමේ මිනිස්සු , වසම් වල ජනතාව බලා ඉන්නවා මේකෙන් ඒගොල්ලන්ට මොනවද ලැබෙන ප්‍රතිලාභ කියලා. ඒ නිසා සාමාන්‍යයෙන් විනාඩි 10, 15ක හැදින්වීමක් කරලා තමයි අයවැය ඉදිරිපත් කරන්නේ. ඉතින් ඇත්තටම මටත් හිතාගන්න බැරිවුණා අයවැය ඉදිරිපත් කළා කියලා. මං ඉල්ලන්නේ ඉදිරි වර්ෂයේදී අපි අයවැය ඉදිරිපත් කරන කොට මීට වඩා දැනෙන්න ඒක ඉදිරිපත් කරන්න කියලා. මොකද ගොඩක් අළුත් මන්ත්‍රීවරු ඉන්නවා. ඒගොල්ලන්ට මේක හොඳට දැනෙන්න ඕනි. අපි කවදාවත් අයවැය පරද්දන්නේ නැහැ. ඒක කරන්නත් බැහැ. ඔය පැත්තේ 20ක් ඉන්නවා. මේ පැත්තේ 17යි ඉන්නේ. අපි අයවැය දින්නම ඒක හැමෝම දන්නවා. එතකොට ඔබතුමාට මේ ආයතනය දෙපාර්ශවයත් එක්කම එකතුවෙලා අරන් පුළුවන් කියලා හැමෝටම අවබෝධ වෙනවා. ඒ අනුව මං ඉදිරිපත් කරපු සංශෝධනයන්ට යටත්ව පසුගිය සභා වාර්තාව සම්මත කිරීම සුදුසුයි කියලා මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.සමන් කුමාර මැතිතුමා**

එම යෝජනාව මම ස්ථිර කරනවා.

- ඒ අනුව පසුගිය නොවැම්බර් මස මහා සභා වාර්තාව සංශෝධන සහිතව සභා සම්මත කිරීමට හා විශේෂ මහා සභා වාර්තාව සංශෝධන නොමැතිව සභා සම්මත කිරීම සුදුසු බව මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**02.සභාපතිවරයා විසින් සභාවට ඉදිරිපත් කළ යුතු නිවේදන**

අපේ ගරු උප සභාපතිතුමා තව විනාඩි කීපයකින් එනවා කියලා දැනුම් දුන්නා. මොකද අවුරුද්ද අවසානය නිසා උත්සව තියෙනවා විශාල වශයෙන් ඒවා ට සම්බන්ධ වෙන්නේ නැතුවත් බැහැ. ඒ නිසා ඒ සඳහා සම්බන්ධ වෙලා තමයි මෙතනට එනවා කිව්වේ. ඇත්තටම පසුගිය දිනවල සුනාමි

ව්‍යවසනයටත් වඩා දැවැන්ත ව්‍යවසනයක් තමයි අපේ රටේ ඇතිවුණේ. නමුත් වාසනාවට බලන්ගොඩට ඒ විදියේ ආපාදාවක් ඇති වුණේ නැහැ. තද සුළඟයි, ලයිට් නැතිවුණ එකයි විතරයි වුණේ. අපිට ඉන්න තැනක් තිබ්බා. හැබැයි ඉන්න තැනක්වත් නැතුව තමන්ගේ ඇඳි වත විතරක් ඉතුරුවුණු අය බොහෝ දෙනෙක් ඉන්නවා. ඒ වගේම ලක්ෂ සංඛ්‍යාත ජනතාවකගේ ජීවිත විනාශ වෙලා ගියා. ඒ වගේම මම කියන්න ඕනි අපේ සභාවේ සුභ සාධක සමිතිය මගින් ලක්ෂ එකහමාරක මුදලක් අපිට පරිත්‍යාග කළා අවතැන් වූවන්ට උදව් කරන්න කියලා. ඒ වගේම අපේ කාර්මණ්ලයේ මහත්මියකගේ පුතෙක් ඉන්නවා විදේශ ගත වෙලා. එයාගේ පළවෙනි පඩියෙන් රුපියල් 50000/= වෙනම දුන්නා මේ මිනිස්සුන්ට උදව් කරන්න කියලා. ආසනයක් විදියට අපිට පිරිසිදු කරන්න භාර දුන්නේ මහියංගනය. අපේ සංවිධාකවරු, මන්ත්‍රීවරු විශාල වශයෙන් මේකට සම්බන්ධ වුණා. ඒ වගේම 5000ක් විතර සම්බන්ධ වුණා වාරි මෙහෙයුමට. හැමෝම මේ වෙනුවෙන් දැවැන්ත වෙහෙසක් ගත්තා. අනාගතයේ අපේ දූවා දරුවන්ට මෙවැනි තත්ත්වයත් ඇති නොවන්න අපි කටයුතු කරන්න ඕනි. මේක මහා ව්‍යවසනයක්. මේක දැක්කා මීට කලින්. 1971 අප්‍රේල් වලට කලින් මාර්තු මාසේ එක්තරා දිනයකදී හයිඩ් පිටියේ තිබුණු මහා ජන රැළියක් අමතලා ඒ මහා දාර්ශනිකයා, මානව හිතවාදියා, මහා දැවැන්ත පණිවිඩයක් අපට දුන්නා. ඒ මහා දාර්ශනිකයා කිව්වා මං මේ කතා කරන්නේ මරණ වරෙන්තුව අතේ තියාගෙන. අපේ රටේ පිහිටීම හරිම වාසනාවන්තයි. රටේ මධ්‍ය කඳුකරයේ පිහිටීම හරියටම රට මැද. විශාල තැන්නක් තියෙනවා. හතර වටෙන්ම මහා මුහුදක් තියෙනවා.අපි ඉතාම සරුසාර රටක්. ගංගා 112 ක් ගලා බහිනවා. මෙන්න මේ අඩි 5000ට වඩා උස මධ්‍ය කඳුකරයේ සුදු අධිරාජ්‍ය විසින් ඔවුන්ගේ වතු වගාවන් ආරම්භ කළා. අපේ රටේ කැලෑ ඔෆිස් එක හදා තියෙන්නෙම කැලෑ කපන්න. ඒ මහා මානවවාදියා කියනවා දැන්වත් මේක නවත්තපලා කියලා. නැත්තම් තව දශක තුන හතරක් යනකොට කඳු කඩාගෙන හැලෙයි. ගංගා පිටාර ගලයි. සමූහ මිනිස් ඝාතන සිද්ධ වෙයි. ඒ වෙනකොට මම ජීවතුන් අතර ඉන්නත් පුළුවන් නොඉන්නත් පුළුවන් කියලා. ඒ මහා මානව හිතවාදියා තමයි රෝහණ විජේවීර. ඉතින් අද ඒකම නෙමෙයිද මේ වෙලා තියෙන්නේ. දැන් ඊයේ තිබුණා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව ඒකේ වලේබොඩ තත්ත්වය කතාකළා. අංශක හැටට වඩා වැඩි බෑවුම්වල තමයි ඒ අය ජීවත් වෙන්නේ. සාමාන්‍ය ක්‍රමේ තමයි අංශක 45 ට වඩා වැඩි බෑවුම්වල ජීවත් වෙන්න බැහැ. අද අපිට මේ තත්ත්වෙන් පුළුවන් වෙලා තියෙනවා ඒ අය පහළට ගේන්න. නැත්තම් මාර යුද්ධයක් කරන්න වෙනවා ඒ අය පහළට ගේන්න. කඳුවලටත් බයයි. වැහි වළාකුළු වලටත් බයයි. දැන් කඳුවල ජීවත් වෙන්න කැමති නැහැ. සමහර තැන් තියෙනවා හමුදාවටවත් යන්න බැහැ. මේ ව්‍යවසනය ගත්තොත් රාජ්‍ය නිළධාරින් මේ තරම් කැප වෙච්ච වකවානුවක් නැහැ. අපේ ග්‍රාම නිළධාරින්ට අපි ස්තුති කරන්න ඕනි. ඒ අය රෑ දවල් දෙකේම ඒවයේ සිටියේ . අවදානම් ගස් එහෙම කපලා අයින් කරන්න පුදුම උනන්දුවක් දැක්වුවේ. සමහර අය ඒ ස්ථානවල හිටියට කන්නවත් නැහැ. ඒ තරමටම රාජ්‍ය නිළධාරින් මැදිහත් වුණා. ඒක නිසා අපි සභාවක් ලෙස සතුටු වෙන්න ඕනි අපි සියළු දෙනාම මැදිහත් වුණා කියලා. ඉස්සරහටත් අපිට මැදිහත් වෙන්න වෙයි. ඒ වගේම අපි මේකෙන් පාඩමක් ඉගෙන ගන්න ඕනි. බලන්ගොඩ කියන්නේ ග්‍රාම සේවක වසම් 53ක් තියෙනවා අපේ සභාවට. මේ සභාවේ අපිට කඳුකර ප්‍රදේශ තියෙනවා. ඒ වගේම තැතිතලා පැතිත් තියෙනවා. අපි මේ හැම තැනකම ඉන්න අය දැනුවත් කරලා, වර්තමාන රජයත් එක්ක සම්බන්ධ වෙලා මේගොල්ලෝ ආරක්ෂිත තැන්වලට සම්බන්ධ කරන්න ඕනි. අපි නිකන් කිව්වට ඒගොල්ලෝ එන්නේ නැහැ. අපි ඒ අයට හොඳ නිෂ්පාදන ආර්ථිකයක් හදලා , රැකියා අවස්ථා උදා කරලා දීලා තමයි ක්‍රමානුකූලව පහළට ගෙන්න ඕනි. ඒ ටික කරන්න මං විශ්වාස කරනවා සභාව පක්ෂ විපක්ෂ නැතුව එකතු වෙලා කටයුතු කරයි කියලා.

## <u>03.සභා රැස්වීමට නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා</u>

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**

අද මාසික සභා රැස්වීමට නොපැමිණ සිටින ගරු මන්ත්‍රීතුමන්ලා සහ තුමියන්ලා ගේ නිවාඩු අනුමත කරන්න තමයි දැන් තියෙන්නේ. ඒ අනුව අද දින ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.යූ.සී.තිලක් වික්‍රමසිංහ මැතිතුමාට සභා රැස්වීමට පැමිණීමට නොහැකි බව දන්වලා ලිපියක් සභාගත කරලා තියෙනවා. ඔහුගේ නිවාඩුව සඳහා අනුමැතිය ලබා දෙන්න කියලා මම මේ ගරු සභාවට යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය බෝවත්තේ ධම්මාරාම හිමි**
එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**
ඒ වගේම ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.නන්දසිරි මැතිතුමාට අද දින සභා රැස්වීමට පැමිණීමට නොහැකි බව දන්වලා ලිපියක් සභාගත කරලා තියෙනවා. ඔහුගේ නිවාඩුවටත් අනුමැතිය ලබා දෙන්න කියලා මම මේ ගරු සභාවට යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය බෝවත්තේ ධම්මාරාම හිමි**
එම යෝජනාව මම ස්ථිර කරනවා.

- ඒ අනුව ඩබ්.යූ.සී.තිලක් වික්‍රමසිංහ මැතිතුමාගේ සහ ආර්.නන්දසිරි මැතිතුමාගේ නිවාඩු සඳහා අනුමැතිය ලබා දීමට මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**04.මාසිකව සභාවට ලැබී ඇති ලියුම් ,පෙත්සම්,පැමිණිලි,සංදේශ හා නිවේදන ඉදිරිපත් කිරීම**
ඉදිරිපත් වී නැත

**05. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න** - ඉදිරිපත් වි නැත.

**06. යථා පරිදි කල් දී ඇති යෝජනා**

### 06-01 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන වරිපනම් ලේඛනයේ නම සංශෝධනය කිරීම සම්බන්ධ යෝජනාව (ඊ.එම්.රංජිත් මයා)

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම්.ආර්.මලිත් ජයසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**
ඊ.එම්.රංජිත් මහතා අපෙන් ඉල්ලීමක් කරලා තියෙනවා රාස්සගල කඩ වීදියේ තියෙන අංක 114 දරන දේපල වරිපනම් ලේඛනයේ සඳහන් වෙලා තියෙන්නේ පෙර අයිතිකරුගේ නමින් නිසා ඔහුගේ නමට ඒ කියන්නේ ඊ.එම්.රංජිත් යන නමින් අපේ වරිපනම් ලේඛනය සංශෝධනය කරලා දෙන්න කියලා. ඒ සඳහා මේ ගරු සභාවේ අනුමැතිය ලබා දෙන්න කියලා මම යෝජනා කරනවා.

- ඒ අනුව රාස්සගල කඩ වීදියේ පවත්නා , අංක 114 දරන දේපල වරිපනම් ලේඛනයේ ඊ.එම්.රංජිත් යන නමින් සංශෝධනය කිරීම සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

### 06-02 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන 2026 වර්ෂයේ මහා සභාව පවත්වනු ලබන දින සඳහා අනුමැතිය ලබා ගැනීම සම්බන්ධ යෝජනාව

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.එල්.පී.කුමාර ගුණසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**
අපි ලබන වර්ෂයේ ඒ කියන්නේ 2026 වර්ෂයේ මහා සභාව පවත්වන දිනයන් සඳහා සභා අනුමැතිය ලබා ගන්න ඕනි. මම ඒ දින ටික සභාවට ඉදිරිපත් කරන්නම් . ඒ සඳහා මේ ගරු සභාවේ අනුමැතිය ලබා දෙන්න කියලා මම යෝජනා කරනවා. ඒ වගේම මේ දිනවල මොනවා හරි සංශෝධනයක් වෙන්න ඕනි නම් කියන්න.

01. ජනවාරි 08 - බ්‍රහස්පතින්දා

| | | |
|---|---|---|
| 02. පෙබරවාරි | 10 | - අගහරුවාදා |
| 03. මාර්තු | 10 | - අගහරුවාදා |
| 04. අප්‍රේල් | 08 | - බදාදා |
| 05. මැයි | 12 | - අගහරුවාදා |
| 06. ජූනි | 10 | - බදාදා |
| 07. ජූලි | 09 | - බ්‍රහස්පතින්දා |
| 08. අගෝස්තු | 06 | - බ්‍රහස්පතින්දා |
| 09. සැප්තැම්බර් | 10 | - බ්‍රහස්පතින්දා |
| 10. ඔක්තෝබර් | 08 | - බ්‍රහස්පතින්දා |
| 11. නොවැම්බර් | 10 | - අගහරුවාදා |
| 12. දෙසැම්බර් | 10 | - බ්‍රහස්පතින්දා |

- ඒ අනුව 2026 වර්ෂයේ මහා සභාව පවත්වන දින සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06-03 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.එම්.සනත් ධර්මරාජ මැතිතුමා විසින් ඉදිරිපත් කරන මහවත්ත තොටුපලතැන්න මාර්ගයට අල්හාජ් - මහුදූන් හාජියාර්ගේ නම යෙදවීම සම්බන්ධ යෝනාව**

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.එම්.ඉක්බාර් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**

මේ යෝජනාව ගැන මම පොඩි අදහසක් ඉදිරිපත් කරන්න ඕනි. මේ යෝජනාව අපිට මන්ත්‍රීතුමාත් ඉදිරිපත් කළා. ඊට පස්සේ අපි මේ අවශ්‍යතාවය ගැන ආගමික මධ්‍යස්ථානය හරහාත් යෝජනාව ගත්තා. අපි මෙතනදි ජාතික සංහිඳියාව වර්ධනය කර ගන්නත් ඕන. අපේ ජාතින් අතර තියෙන්න ඕනි සංහිඳියාව. අපේ අරමුණ තමයි පොහොසත් රටක්, ලස්සන ජීවිතයක් කියන තේමාව. අපේ මේ ප්‍රදේශයේ හැම ජාතියක්ම ඉන්නවා. ජාතිකත්වය කියන හැඟීමෙන් තමයි අපි මේ යෝජනාව ඉදිරිපත් කරන්නේ.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.එම්.සනත් ධර්මරාජ මැතිතුමා</u>**

ගරු සභාපතිතුමනි, මේ යෝජනාව සම්බන්ධව අපිට විවිධ පාර්ශවයන්ගෙන් ඉල්ලීම් ආවා ලිඛිතව සහ වාඩිකව. ප්‍රථමයෙන්ම මවුලවි නවාස් මහතාගෙන් ලිපියක් ආවා. ඒත් එක්කම අත්සන් සියයකට වඩා වැඩියෙන් ඇති අත්සන් සහිත ලිපියක් ආවා. මම ජීවත් වෙන ප්‍රදේශයේ තමයි මේ යෝජනා කරන පාර තියෙන්නේ. අපේ ඉක්බාර් මන්ත්‍රීතුමාත් හොඳින් මේ ගැන දන්නවා. ඒ අනුව අපි මේ යෝජනාව පිළිගන්නවා. ඒත් එක්කම මේ නම් කිරීම පනත අනුව නීත්‍යානුකූල වෙන්න ඕනි නිසා තමයි අපි මේක සභාවට ඉදිරිපත් කරලා අනුමැතිය ගන්නේ. මේ පාර තියෙන්නේ තොටුපලතැන්න පාරේ තියෙනවා සුරස උයන කියලා නිවාස පෙළක්. ඒ නිවාස පෙළ ආසන්නයේ තියෙනවා අනඳමෙත්ගම කියලා නාම පුවරුවක්. ඒ අනඳමෙත්ගම කියලා නම් කරලා තියෙන්නේ ඒ පුවරුවේ ඉඳලා ඉදිරියට තොටුපලතැන්න පැත්තට. ඒ පුවරුව ඉදිරිපිටින් තියෙන හරස්පාර තමයි අපි මේ නම් කරන්න ඉල්ලන පාර වෙන්නේ. මේක කිරිමැටිතැන්න ග්‍රාම නිළධාරි වසමට අයිති වෙන්නේ. ඒ අනුව අපි යෝජනා කරනවා මේ පාර මහුදූන් හාජියාර්ගේ නමින් නම් කරන්න කියලා. අපි දන්නවා මොහු ව්‍යාපාරිකයෙක් සහ විශාල සමාජ සේවාවක් කරපු පුද්ගලයෙක්. තාමත් එයාගේ ප්‍රතිලාභ ඒ ගමේ ජනතාවට ලැබෙනවා. ඒ වගේම ඔහු මුස්ලිම් ප්‍රජාව සමගක් පමණක් නොවේ සිංහල ප්‍රජාව එක්කත් හරිම ළගින් තමයි කටයුතු කරලා තියෙන්නේ. ඔහු අද ජීවතුන් අතර නැතත් අදටත් මිනිස්සුන්ට ප්‍රතිලාභ ලබා දෙන පදනමක් ඔහු ආරම්භ කරලා තියෙනවා. ඊළඟට මේ ග්‍රාම නිළධාරි වසම කිරිමැටිතැන්න, ඊළඟ වසම තොටුපලතැන්න, ඊළග වසම දෙහිගස්තලාව වසම . ඒ ආසන්නයේ මාර්ග පද්ධතියකට මේක සම්බන්ධ වෙලා තියෙන්නේ. අපි මේ නම යෝජනා කරන්න පෙර මිලියන 07ට ආසන්න ප්‍රමාණයක් වැය කරලා ව්‍යාපෘති 04ක් යටතේ මේ පාරවල් ටික සංවර්ධනය කරලා තියෙන්නේ. ඒ අනුව එම ව්‍යාපෘති 04 යටතේ මුලින්ම ලක්ෂ 05ක් , ඊට පස්සේ ලක්ෂ 35ක් , ඊට පස්සෙ ලක්ෂ 20ක් , ඊට පස්සේ ලක්ෂ 09ක් විදියට, ලක්ෂ 69ක් වැය කරලා මේ පාරවල් ටික සංවර්ධනය කරලා යෝජනා

කරනවා මේ මාර්ගය අල්හාජ් මහුදූන් හාජියාර්ගේ නමින් නම් කරන්න කියලා. ඒත් එක්කම ඒ ප්‍රජාව ඉතාම අපහසුවෙන් ජීවත් වන පිරිසක්. මේ ගමට නමක් නැහැ. අපිට මතකයි අපි එෆ්.එච්.මාවත නම් කරන කොට ඒ ගමම දැන් එෆ්.එච්.මාවත කියලා හඳුන්වන්නේ. ඒ වගේ මේ ප්‍රදේශයේ මිනිස්සුන්ට ලස්සන ජීවිතයක් කියන අපේ ජාතික වැඩපිළිවෙල යටතේ ඒ අයට තමන් ජීවත් වෙන ප්‍රදේශයේ සතුටින් ජීවත් වෙන්න ගමක් නම් කරන්න අවස්ථාව ලැබෙනවා අපිට මේකෙන්. මේ යෝජනාව මම අපි අතර සංහිඳියාව ඇති කරන්න ඕන නිසා ඉදිරිපත් කළේ. ඒ අනුව මම යෝජනා කරනවා සුරස උයන නිවාස පෙළ ඉදිරිපිට ඇති මේ මාර්ගය අල්හාජ් මහුදූන් හාජියාර්ගේ නමින් නම් කිරීම සුදුසුයි කියලා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.එම්.ඉක්බාර් මැතිතුමා</u>**

ගරු සභාපතිතුමනි ඔය මාර්ගයට අදාළ ඉඩම් 2018 වගේ අබුසාලි මහත්තයාගෙන් තමයි අරන් තියෙන්නේ. අක්කර 08ක් තියෙනවා. ගෙවල් එකසිය ගාණක් තියෙනවා. එදා ඉඳන් ඕතන පාර තිබුණට ඒකට නමක් නෑ. එක එක නම්වලින් ඔය පාර හඳුන්වනවා. ලියුම් බෙදන කෙනා ආවාම එයත් හරිම අපහසුතාවයට පත් වෙනවා. ඕක මවුලවි හාජියාර් ඉන්නකම් හරියට කරගෙන ගියා. දැන් එයාගේ පුතා තමයි කරගෙන යන්නේ. අපේ ගමේ කට්ටියට කියලා තිබුණා ඒ පාරට හාජියාර්ගේ නම දාන්න ඕනි කියලා. අපේ සමිතියේ සභාපතිතුමා තමයි මේකට මහන්සි වෙලා ලියුම් හදලා සභාපතිතුමාටත් කතා කරලා තිබුණේ. ඉතින් එයාට උවමනා වෙලා තිබුණේ ඒ නම දාලා ගමට නමක් ලබා දෙන්න තමයි. ඉතින් මම ස්තූතිවන්ත වෙනවා අපේ ගරු සභාපතිතුමාටත්, සනත් මන්ත්‍රීතුමාටත් මේකට මූලික වුණාට. ඉස්සර 2018 කොරෝනා කාලේ එතන නමක් තිබුණේ නැහැ. අනඳමෙත්පුර කියලා නමක් තිබුණේ. ඒ අනඳමෙත්පුර බෝඩ් එක දාලා තිබුනේ මේ පාර ගාව. තව එකක් තියෙනවා සභාපතිතුමා, එතන පාරවල් හදලා තියෙනවා සමහර තැන්වල හදලා නැහැ. ලක්ෂ 03ක් විතර යනකොට ඒ ටික හදන්න පුළුවන්. ඉතින් මම ඉල්ලනවා ඒ ටිකත් හදලා දාන්න කියලා.

- ඒ අනුව තොටුපලතැන්න සුරස උයන නිවාස පෙළ ඉදිරිපිට, අනඳමෙත්පුර නාම පුවරුව අසළ අතුරු මාර්ගයට අල්හාජ් -මහුදූන් හාජියාර්ගේ නම යෙදීම සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

### 06-04 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන 2026 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන සැලැස්ම අනුමත කරවා ගැනීම සම්බන්ධ යෝජනාව

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය බෝවත්තේ ධම්මාරාම හිමියන් විසින් ස්ථිර කරන ලදී.

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**

අපේ සභාව මගින් 2026 වර්ෂයේ ඉදිරි කටයුතු කරන්නේ කොහොමද සැලසුම් කරලා තියෙන්නේ මේ කාර්ය සාධන සැලැස්ම මගින්. එතකොට ඒ ඒ විෂයන් 2026 වර්ෂයේ ක්‍රියාත්මක කරන්න අපේක්ෂිත කාර්යයන් හා වැඩසටහන් කොහොමද ඉටු කරන්නේ කියලා මේකේ අන්තර්ගත වෙලා තියෙනවා. ඒ අනුව මේ වාර්ෂික කාර්යසාධන සැලැස්ම සඳහා ගරු සභාවේ අනුමැතිය ලබා දෙන්න කියලා මම යෝජනා කරනවා.

- ඒ අනුව 2026 වර්ෂයේ වාර්ෂික කාර්ය සාධන සැලැස්ම සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

### 06-05 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන 2026 වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම අනුමත කර ගැනීම සම්බන්ධ යෝජනාව

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඩබ්.පී.චන්ද්‍රාණි නන්දරත්න මැතිනිය විසින් ස්ථිර කරන ලදී.

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**

2026 වර්ෂයේ වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සභා අනුමැතියට ඉදිරිපත් කරලා තියෙනවා. මේකේදී අපේ එක් එක් විෂයන් තමන්ගේ විෂය පථය තුළ ඉදිරි වර්ෂයේදී ක්‍රියා කරන්නේ කොහොමද කියලා තමයි සැලැස්මකට අනුව හදලා තියෙන්නේ. මේ සඳහා ගරු සභාවේ අනුමැතිය ලබා දෙන්න කියලා මම යෝජනා කරනවා.

- ඒ අනුව 2026 වර්ෂයේ වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06-06 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන 2026 වර්ෂය සඳහා වාර්ෂික පුහුණු සැලැස්ම අනුමත කර ගැනීම සම්බන්ධ යෝජනාව**

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි පූජ්‍ය බෝවත්තේ ධම්මාරාම හිමියන් විසින් ස්ථිර කරන ලදී.

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**

2026 වර්ෂයට අදාළ පුහුණු සැලැස්ම අපිට ඉදිරිපත් කරලා තියෙනවා. කාර්තු විදියට 2026 වර්ෂයේදී කරන්න අපේක්ෂා කරන පුහුණු අන්තර්ගත කරලා තමයි මේ සකස් කරලා තියෙන්නේ. අපේ බලාපොරොත්තුව තමයි සුපිළිපන්න රාජ්‍ය සේවකයෙක් බිහි කිරීම. මොකද අපි මහජනතාවට වග කියන්න ඕනි අපි වැටුප් ලබන්නේ ඒ අයගේ බදු මුදල් වලින් නිසා. ඒ නිසා තමයි වාර්ෂිකව මේ වගේ පුහුණු සැලැස්මක් හදලා අපේ අයව පුහුණු කරන්නේ. ඒ අනුව 2026 වර්ෂයේ පුහුණු සැලැස්ම සඳහා මේ ගරු සභාවේ අනුමැතිය ලබා දෙන්න කියලා මම යෝජනා කරනවා.

- ඒ අනුව 2026 වර්ෂයේ පුහුණු සැලැස්ම සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06-07 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන 2026 වර්ෂය සඳහා වාර්ෂික විගණන සැලැස්ම අනුමත කර ගැනීම සම්බන්ධ යෝජනාව**

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි පූජ්‍ය බෝවත්තේ ධම්මාරාම හිමියන් විසින් ස්ථිර කරන ලදී.

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**

2026 වර්ෂයට අදාළ විගණන හා කළමනාකරණ කමිටු සැලැස්ම සභාව වෙත ඉදිරිපත් කරලා තියනවා. මේකට අපේ මන්ත්‍රීවරු සම්බන්ධ කර ගන්නේ නැහැ. නිළධාරින් තමයි සම්බන්ධ වෙන්නේ. ලබන වසරේ විගණන කමිටුව පැවැත්වීමට අපේක්ෂා කරන දින ටික මම කියන්නම්. මේක කාර්තු වශයෙන් තමයි පැවැත්වෙන්නේ.

- ✓ පළමු කාර්තුව - 2026 අප්‍රේල් 23 බ්‍රහස්පතින්දා
- ✓ දෙවන කාර්තුව - 2026 ජුනි 18 බ්‍රහස්පතින්දා
- ✓ තුන්වන කාර්තුව - 2026 සැප්තැම්බර් 17 බ්‍රහස්පතිනදා
- ✓ සිව්වන කාර්තුව - 2026 දෙසැම්බර් 17 බ්‍රහස්පතිනදා

- ඒ අනුව 2026 වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු සැලැස්ම සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06-08 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන 2026 වර්ෂය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම අනුමත කර ගැනීම සම්බන්ධ යෝජනාව**

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි පූජ්‍ය බෝවත්තේ ධම්මාරාම හිමියන් විසින් ස්ථිර කරන ලදී.

<u>**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**</u>

2026 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම අපිට සභා අනුමැතියට ඉදිරිපත් කරලා තියෙනවා. සුපිළිපන්න රටක් නිර්මාණය කරන කොට අපිට මේ ප්‍රසම්පාදනය හරිම වැදගත්. එතකොට මේ සැලැස්ම හදලා තියෙන්නේ අපි ලබන අවුරුද්දේ කරන්න අපේක්ෂිත මිලදී ගැනීම් , අළුත්වැඩියා කිරීම් වගේ දේවල් මොනවද, ඒ සඳහා භාවිතා කරන ප්‍රසම්පාදන ක්‍රම මොනවද කියන එක අන්තර්ගත කරලා. ඒ අනුව 2026 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට මේ ගරු සභාවේ අනුමැතිය ලබා දෙන්න කියලා මම යෝජනා කරනවා.

- ඒ අනුව 2026 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06-09 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන සභා බල ප්‍රදේශය තුළ ඇති B38 හා B39 මාර්ගවල පවත්නා බළන්ගොඩ ප්‍රාදේශීය සභාවව සතු පාරවල් සහ පටු මාවත්වල අයිතිය ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධ යෝජනාව**

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය බෝවත්තේ ධම්මාරාම හිමියන් විසින් ස්ථිර කරන ලදී.

<u>**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**</u>

අපේ සභා බල ප්‍රදේශය තුළ තියෙන B38 , B39 කියන මාර්ගවල , ප්‍රාදේශීය සභාව සතු පාරවල් සහ පටු මාවත් අති විශේෂ ගැසට් පත්‍රයක් විදියට පළමු වරට ගැසට් කිරීම සඳහා සභාවේ අනුමැතිය අවශ්‍ය වෙනවා. මේ මාර්ග වලට අයිති පාරවල් වල නාම ලේඛනය මං ගාව තියෙනවා. මේ ලේඛන දෙකේම පාරවල් විශාල ප්‍රමාණයක් තියෙනවා. මෙතන ඉදිරිපත් කරන්න බැරි නිසා ඔබතුමන්ලාට සහ ඔබතුමියන්ලාට පුළුවන් අවශ්‍ය ඕනම වෙලාවක මේක ලබා ගෙන පරිශීලනය කරලා අවබෝධයක් ලබා ගන්න. ඒ අනුව මේ සඳහා අනුමැතිය ලබා දෙන්න කියලා මම මේ ගරු සභාවට යෝජනා කරනවා.

- ඒ අනුව බළන්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවත්නා B38 , B39 යන මාර්ගවල , ප්‍රාදේශීය සභාව සතු පාරවල් සහ පටු මාවත් අති විශේෂ ගැසට් පත්‍රයක් විදියට පළමු වරට ගැසට් කිරීම සඳහා සභාවේ අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06-10 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව සහ දැන්වීම් පුවරු, වෙනත් තාවකාලික නිර්මාණ සහ සැරසිලි කටයුතු පවත්වා ගෙන යාම සම්බන්ධ අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට අනුමැතිය ලබා ගැනිම සම්බන්ධ යෝජනාව**

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.එම්.සනත් ධර්මරාජ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**</u>

මේ අතුරු ව්‍යවස්ථාව මං හිතන්නේ වාර්තාවත් එක්ක හැමෝටම යවලා තියෙන්නේ. මේක පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් හැම පළාත් පාලන ආයතනයකටම එවලා තියෙනවා මොනව හරි සංශෝධන වෙන්න තියෙනවනම් ඒවා සංශෝධනය කරලා, සභාවේ අනුමැතිය අරගෙන, භාෂා තුනෙන්ම සකස් කරලා ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතියට, පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා මගින් ඉදිරිපත් කරන්න කියලා. මේකේ මොනව හරි සංශෝධනයක් වෙන්න තියෙනවනම් සභාවට ඉදිරිපත් කරන්න. එහෙම මොකුත් නැත්තම් සභාවේ අනුමැතිය ලබා දෙන්න කියලා මම යෝජනා කරනවා.

- ඒ අනුව ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව සහ දැන්වීම් පුවරු, වෙනත් තාවකාලික නිර්මාණ සහ සැරසිලි කටයුතු පවත්වා ගෙන යාම සම්බන්ධ අතුරු ව්‍යවස්ථාව භාෂාත්‍රයෙන්

සකස් කොට, පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා මගින් ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතියට ඉදිරිපත් කිරීම සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**<u>හදිසි යෝජනා</u>**

**06-11 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන 2025 වර්ෂයේ අවසන් කළ නොහැකි වූ කර්මාන්තවලට ලබා දී ඇති කාලය 2026-01-31 දක්වා දීර්ඝ කිරීමටඅනුමැතිය ලබා ගැනිම සම්බන්ධ යෝජනාව**

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය බෝවත්තේ ධම්මාරාම හිමියන් විසින් ස්ථිර කරන ලදී.

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**
හදිසියේ ඇති වුණු ආපදා තත්වයත් එක්ක තමයි අපිට මේ හදිසි යෝජනාව ඉදිරිපත් කරන්න සිද්ධ වුණේ. මොකද අපේ රටේ පසුගිය දින කීපය තුළ තිබූ කාළගුණික තත්ත්වය පිළිබඳ අපි කවුරුත් හොඳින් දන්නවා. ඒ නිසා අමුද්‍රව්‍ය සපයා ගැනීමට සහ ප්‍රවාහනයට බාධා ඇති වීම නිසා අපිට 2025-12-31 දිනට අවසන් කරන්න තිබුණු කර්මාන්ත කීපයක් අවසන් කර ගන්න අපහසු වෙලා තියෙනවා. ඒ අනුව අපිට මේ කර්මාන්ත 2026-01-31 දින දක්වා කාලය දීර්ඝ කර ගන්න ඕනි. ඒක නීත්‍යානුකූලව සහ විධිමත්ව කරන්න ඕනි නිසයි අපි මහා සභාවට ඉදිරිපත් කළේ. අපි මේකට සභා අනුමැතිය අරගෙන පළාත් පාලන කොමසාරිස්තුමා මගින් ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ට ඉදිරිපත් කරලා තමයි කාලය දීර්ඝ කර ගන්න ඕනි. ඒ සඳහා මේ ගරු සභාවේ අනුමැතිය ලබා දෙන්න කියලා මම යෝජනා කරනවා.

- ඒ අනුව 2025 සංවර්ධන ව්‍යාපෘති නිම කිරීමට ලබා දී තිබූ කාලය 2026-01-31 දක්වා දීර්ඝ කිරීම සඳහා ඉල්ලුම් කිරීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06-12 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන ස්වභාවික ව්‍යවසන තත්වයන් හමුවේ ජන ජීවිතය යථාවත් කිරීමට පියවර ගැනීම සම්බන්ධ යෝජනාව.**

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය බෝවත්තේ ධම්මාරාම හිමියන් විසින් ස්ථිර කරන ලදී.

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**
දැන් අපේ හාමුදුරුවනේ අපට තියෙනවා අනතුරුදායක ගස්. අපි ඇත්තටම සභාවක් විදයට වැඩියෙන්ම අත්සන් කරන්නේ අනතුරුදායක ගස් සම්බන්ධ ලියුම්වලට. හැබැයි අපට ප්‍රශ්නයක් තිබුණා මේ අනතුරුදායක ගස් ඉවත් කරන්න අපට මෙහේ ප්‍රතිපාදන නැහැ. අපට මෙහේ සේවකයෝ නැහැ ගස් කපන්න. අපේ මන්ත්‍රීවරු සහ මන්ත්‍රීතුමියන්ලාට වගකීමක් තියෙනවා සභාව පිළිබඳ හරි අවබෝධයක් තමන්ගේ කොට්ඨාශයේ මහජනතාවට ලබා දෙන්න. නැත්තම් අපේ පුරවැසියෝ හිතාගෙන ඉන්නෙ සභාව තියෙන්නෙම ගස් කපන්න කියලා. අපි මේ සම්බන්ධයෙන් අදාළ සියළුම පාර්ශවයන් එක්ක සාකච්ඡා කළා. එතකොට මේ ප්‍රශ්නය අපිට වගේම අනිත් සභාවලටත් පොදුවේ තියෙන ප්‍රශ්නයක්. එතකොට අපිට පළාත් සභාවෙන් ආපදා තත්ත්වය තුළ ඒ ආපදාවලින් ජනතාව මුදා ගැනීම සඳහා අපිට ප්‍රතිපාදන වෙන් කරලා තියෙනවා. පොදුවේ ගත්තම ලක්ෂ 50ක්. එතකොට අපේ මන්ත්‍රීතුමන්ලා සහ තුමියන්ලා අපට තියෙනවා අනතුරුදායක ගස්, ඊට අමතරව පාරවල් වල කාණු පිරිලා තියෙනවා, අපි ඒවා සුද්ධ කරන්න ඕනි. එතනදි අපිට උපදෙස් දුන්නා මේ අනතුරුදායක බව අදාළ වන්නේ මොන ආයතනයටද කියලා නොබලා අවස්ථාවට ගැලපෙන පරිදි කටයුතු කරන්න කියලා. මොකද මේ සෑම අයතනයක්ම රජයේ ආයතන.ඒ වගේම අපේ බල ප්‍රදේශයේ නාය යෑමේ අවදානම් ප්‍රදේශ විදියට නම් කරපු ස්ථාන තියෙනවා.පෙට්ටිගල, වලේබොඩ වගේ ප්‍රදේශ.මේ වන විට අපේ **JCB** දෙකම තියෙන්නේ අක්‍රීය තත්වයේ.හදිස්සි නාය යෑමක් වුනොත් ඒ වෙනුවෙන් සූදානම් වීමට **JCB** එක අලුත් වැඩියා කර ගැනීමට අත්‍යවශ්‍ය කරුණක්.ඒ නිසා මෙම ආපදාව වෙනුවෙන් වෙන් වූ මුදල් වලින් **JCB** යන්ත්‍රය අලුත් වැඩියා කර ගැනීමක් සිදු කරමු කියලා මම යෝජනා කරනවා. අපිට

මේ ප්‍රතිපාදන වෙන් වෙන්නේ රජයෙන්. එතකොට පවතින අපදා තත්ත්වයට අනුව කටයුතු කරලා ඒකට අපේ සභාවෙන් දරන වියදම බිල් කරලා අපි වියදම ප්‍රතිපූර්ණය කර ගන්න පළාත් සභාවට ඉදිරිපත් කරන්න ඕනි. එතකොට අපිට මේ සඳහා සභා අනුමැතිය අවශ්‍ය වෙන නිසා අවශ්‍ය අනුමැතිය ලබා දෙන්න කියලා මම මේ ගරු සභාවට යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය බෝවත්තේ ධම්මාරාම හිමි</u>**
සභාපතිතුමා මේ වගේ දෙයක් ආවාම ඔබතුමා අපෙන් අහ අහ ඉන්න ඕනි නැහැ. ඒ සම්බන්ධයෙන් අවශ්‍ය තීන්දු ගන්න ඔබතුමාට අපි බලය දීලා තියෙනවා. අපෙන් අහන්නේ නැතිව ඔබතුමා මේ වගේ අනතුරුදායක අවස්ථාවලදී වැඩ කළා කියලා අපි ඔබතුමාට විරුද්ධ වෙන්නේ නැහැ. ඒ නිසා මේවැනි අවස්ථාවලදී ඔබතුමා සුදුසු විදියට , සාධාරණව තීන්දු තීරණ ගන්න. අපි සහයෝගය දෙනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.එම්.ඉක්බාර් මැතිතුමා</u>**
සභාපතිතුමා විකිළියෙත් මෙවැනි අනතුරුදායක ගහක් තියෙනවා. මේ කඩා වැටුණොත් එහෙම ඒ හරියේ තියෙන ගෙවල් 05ට විතර හානි වෙනවා කියලා තමයි ඒ අය කියන්නේ . ඉතින් ඒ අයට මේ ගහ ඉවත් කරන්න හැකියාව නැහැ කිව්වා. මේ සම්බන්ව සභාවට ලිපියක් යොමු කළා කිව්වා. ඒ වගේම මෙතන අලුතින් කොන්ක්‍රීට් කරපු පාරක් තියෙන්නේ. ඒ නිසා මේ ගහ කඩා වැටුණොත් ඒකත් විනාශ වෙලා යනවා. මේක තියෙන්නෙත් සභාවට අයිති ඉඩමක .අපිට බලය තියෙනවා මේ වගේ ඒවා ඉවත් කරන්න. ඒ නිසා මේ පිළිබදවත් අවධානය යොමු කරන්න කියලා ඉල්ලවා.

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**
අපිට හාමුදුරුවනේ බලය තියෙනවා. නමුත් මෙතන තිබුණේ පොදුවේ මේ වෙන් කරන ලක්ෂ 50ක් වන ප්‍රතිපාදන සඳහා අනුමැතිය ලබා ගන්න. ඒක නිසයි සභාවට ඉදිරිපත් කළේ. එතකොට අපිට මේ මුදල් වෙන කිසිම දේකට වියදම් කරන්න බැහැ. මේ ආපදා තත්ත්වයට අදාළව මේ කාරණයට විතරමයි වියදම් කරන්න පුළුවන්.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඩී.ඩී.ජයශීලි ලියනගේ මැතිනිය</u>**
සභාපතිතුමා අර ඉක්බාර් මන්ත්‍රීතුමා කිව්ව ගහ සභාවට අයත් ඉඩමක තමයි තියෙන්නේ. ඒක කඩා වැටුණොත් ඒ හරියේ තියෙන නිවාස ටිකට හානි වෙනවා. අඩුම තරමේ අතු ටික හරි කපලා ඉවත් කරන්න පුළුවන් නම් හොඳයි. ඒ වගේම මගේ බටුගම්මන වසමෙත් තියෙනවා ගහක්. ඒ වගේම රක්ෂිත මාර්ගය අසළ තියෙන නිවසකටත් බාධාවෙන ගසක් තියෙනවා ඒකත් ඉවත් කරන්න කියලා ඉල්ලනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම්.ආර්.මලිත් ජයසේන මැතිතුමා</u>**
ගරු සභාපතිතුමා, අපි මීට කලිනුත් මේ වගේ අවස්ථාවන්ට මුහුණ දීලා තියෙනවා. එතකොට අනීතිකව නෙවෙයි නීත්‍යානුකූලව සභාවට අයත් සේවකයෝ , ට්‍රැක්ටර් රථ එහෙම එළියට බැහැලා ඒ ආපදා තත්ත්ව අවම කරන්න වැඩ කළා. ඒ වගේම දැන් ගරු ජනාධිපතිතුමා ලොකු මෙහෙවරක් කරනවා . ඉතින් මම යෝජනා කරන්නේ සභාපතිතුමා අපේ වසම් 53ක් තියෙනවා. ඒ වසම් ටික මේ ලක්ෂ 50ක් වගේ මුදලක් කොහොමත් ප්‍රමාණවත් වෙන්නේ නැහැ. අපි මහජන නියෝජිතයෝ විදියට පැය 24ම ජනතාව වෙනුවෙන් පෙනී ඉන්න ඕනි. දැන් ඉස්සරහට ඊසාන දිග මෝසම් එනවා. එතකොට පොඩි පොඩි ආපදා තත්ත්ව ඇති වෙන්න පුළුවන්. ඔබතුමාට පුළුවන් පොඩි රැස්වීමක් කැඳවලා සාකච්ඡාවක් තියලා ඒ ආපදා තත්ත්ව වලට හොඳින් මුහුණ දෙන්න පුළුවන් සැලැස්මක් හදන්න. එතකොට අපිට පුළුවන් රත්නපුර දිස්ත්‍රික්කය තුළ ආදර්ශමත් පළාත් පාලන ආයතනයක් වෙන්න.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.පී.නිලන්ති වීරවංශ මැතිනිය</u>**
ගරු සභාපතිතුමනි. මගේ මේ දාමහන කොට්ඨාශයේ ගසක් කඩා වැටුණා 27 වෙනිදා. තාමත් ඒ ගස ගොඩනැගිල්ල උඩ තියෙනවා. අයින් කරගන්න ඒ අයට හැකියාවක් නැහැ. ඉතින් ඒ පුද්ගලයාට විශාල හානියක් වෙලා තියෙනවා. ඉතින් මම ඉල්ලන්නේ ඒක සභාවේ යුතුකමක් විදියට අයින් කරලා දෙන්න පුළුවන් නම් හොඳයි කියලා.

- ඒ අනුව ස්වභාවික ව්‍යවසන තත්වය හමුවේ ජන ජීවිතය යථාවත් කිරීම සඳහා පියවර ගැනීම වෙනුවෙන් ලබා දෙන අතිරේක ප්‍රතිපාදන යොදාගෙන පවතින අණතුරුදායක ගස් ඉවත් කිරීමටත් සභාවේ පවතින JCB යන්ත්‍රය අලුත් වැඩියා කිරීමටත් සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

## 07. කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම

<u>**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**</u>

7.1ටෙන්ඩර් කමිටු වාර්තා 2025-11-11 , 2025-11-17 ,2025-11

- සභාව විසින් සළකා බලන ලදී.

7.2මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව 2025-11-24

- සභාව විසින් සළකා බලන ලදී.

## 08. ලැබීම් වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ , එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කළ යුතු වෙනත් ලේඛන

<u>**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**</u>

2025 නොවැම්බර් මාසයට අදාළ ලැබීම් වියදම් පිළිබඳ මාසික ප්‍රකාශය සහ එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තාව ගරු සභාව වෙත සළකා බැලීම සඳහා ඉදිරිපත් කරනවා.

- සභාව විසින් සළකා බලන ලදී.

- ❖ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මුදිත ප්‍රසාද් මල්ලිකාරත්න මැතිතුමා පෙ.ව.11.30 ට මහා සභා රැස්වීම සඳහා පැමිණෙන ලදී.

## 09.සභිකවරුන්ගේ පෞද්ගලික පැහැදිලි කිරීම්

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.එම්.ඉක්බාර් මැතිතුමා**</u>

සභාපතිතුමා අපේ නිවාස කමිටුව මාස 03න් තිබ්බේ නැහැ. ඇයි කියලා දන්නෙත් නැහැ. මම කමිටු සභාපතිතුමාගෙනුත් ඇහුවා ඇයි තියන්නේ නැත්තේ කියලා. ඉතින් එතුමා කිව්වා අපි කියන ඒවා ඉෂ්ඨ වෙන්නේ නැහැනේ ඒක නිසා කියලා. දැන් අපේ අනිත් කමිටු තියනවනේ. ඉතින් මේකත් තිව්ව නම් හොඳයි. තව දෙයක් තියෙනවා සභාපතිතුමා අපේ සනත් මන්තීත්‍රමා පාරවල් වල මොනවහරි වැඩසටහනක් කරනවනම් මට කියනවා මන්ත්‍රීතුමා අපි මේ වගේ දෙයක් කරනවා කියලා දැනුවත් කරනවා. නමුත් මගේ කොට්ඨාශයේ ඉන්නවා අස්ලම් කියලා ලිස්ට් එකෙන් ඉල්ලපු කෙනෙක්. එයාත් මේ වගේ වැඩසටහන් කරනවා. නමුත් කවදාවත් අපිට කියන්නෙත් නැහැ, අපිව සම්බන්ධ කරගන්නෙත් නැහැ. ඉතින් අස්ලම් කාණු පද්ධතියක් හැදුවා. අපිට කිව්වෙත් නැහැ. පස්සේ පෙරේදා මම ගිහිල්ලා බලනකොට ගැඹුර අඩි 1.5 විතරයි පළල අඩි 1.5ක් විතරයි ප්‍රමාණයකට දාලා තියෙන්නේ. ඉතින් අර එන වතුර පාරට ඒක මදි. ඒ නිසා කාණු උතුරලා යන්න ඉඩ තියෙනවා. ඒ නිසා අර කාණුව පළල් කරලා හදන්න ඕනි සභාපතිතුමා. සභාපතිතුමා මම කියන්නේ අපේ මේ මන්ත්‍රීතුමා වගේ මොනවහරි ඒ වගේ දෙයක් කරනකොට අපිවත් සහභාගි කරවගන්න කියලා. මොකද අඩුපාඩුවක් තියනවනම් අපිට කියල දෙන්න පුළුවන් නිසා. ඉතින් අස්ලම්, අපි ඒ වගේ දෙයකට සහභාගි වුණොත් අපිටත් මොනවහරි දෙයක් කියනවා. ඒ නිසා සභාපතිතුමා මම ඉල්ලන්නේ මේ වගේ මොනව හරි දෙයක් කරන කොට අපිවත් සම්බන්ධ කර ගන්න කියලා.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ජී.දනුෂ්ක සමන්ත කුමාර මැතිතුමා**</u>

ගරු සභාපතිතුමාගෙන් අවසරයි, ස්වාමින් වහන්සේ ඇතුළු පක්ෂ විපක්ෂ සියළු දෙනාගෙන්ම අවසරයි, අපේ ගමේ සභාපතිතුමනි පන්සලක් තියෙනවා. ඒ පන්සල මීට වසර 05කට පමණ කලින් තමයි ඉදි කළේ. අද ඒ පන්සල දායකයන් 200ගෙන් පමණ සමන්විත වෙනවා. එතකොට ඒ දහම් පාසලෙත් දරුවෝ 100ක් විතර ඉන්නවා. ඉතින් සභාපතිතුමනි මේ වෙනකොට ෆොරෙස්ට් එකෙන් ඒකට නඩුවක් දාලා තියෙනවා. නඩුකාරතුමියත් පන්සලට ආවා. ඇවිල්ලා කිව්වේ මේක පන්සලට නිදහස් කරන්න පුළුවන් ඉඩමක්. ඒ නිසා ෆොරෙස්ට් එකට කිව්වා නඩුව ඉවත් කර ගන්න කියලා. නමුත් නැවත වතාවක් ෆොරෙස්ට් එක පන්සල නැවත අයිති කර ගන්න කියලා කියනවා. මේ වෙනකොටත් බළන්ගොඩ උසාවියේ ඒ නඩුව අහනවා. ඊයේ පෙරේදා දවස් දෙකේ මම නීතිඥතුමත් එක්ක කතාකළාම එතුමා කිව්වේ ඉදිකිරීම් තහනම් නියෝගයක් උසාවිය විසින් නිකුත් කරන්න තියෙනවා කියලා. එතකොට නීතිඥතුමා කිව්වේ මේක විසඳගන්න පුළුවන් එකම මාර්ගය තමයි දේශපාලන අධිකාරිය කියලා. ඉතින් අපේ කොට්ඨාශයේ සහෝදර ජගත් මන්ත්‍රීතුමාගෙනුත් මම ඉල්ලීමක් කරනවා මේකට මැදිහත් වෙන්න කියලා. මේ ප්‍රශ්නය ගැන කතා කරන්න ඊයේ දායක සභාව තිබුණා . ඉතින් ඒ අය ඔබතුමා ගමට එනකම් බලා ඉන්නවා මේක විසඳගන්න. ඉතින් මම ඔබතුමාගෙන් ඉල්ලන්නේ ගමට ඇවිල්ලා මේක විසඳලා දෙන්න කියලා. මොකද ඉතාමත්ම කෙටි කාලෙකින් මේකට තහනම් නියෝගයක් නිකුත් කරනවා. ගමේ දායකයන් දැඩිව ඉන්නවා පන්සල ඕනම කියලා. ඒ වෙනුවෙන් ඔවුන් ඕනෑම ක්‍රියාමාර්ගයකට යන්න, උද්ඝෝෂණයකට යන්න වුණත් සූදානමින් ඉන්නවා. ඒ නිසා ඒ වගේ තැනකට නොයවා ඔබතුමයි, උපසභාපතිතුමයි මේකට මැදිහත් වෙලා ගමට ඇවිල්ලා මේකට විසඳුමක් ලබා දෙන්න කියලා සහ අපේ පන්සල ගමට නිදහස් කරලා දෙන්න කියලා මම ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය බෝවත්තේ ධම්මාරාම හිමි</u>**

සභාපතිතුමනි , ඔබතුමා මේ සභාවේ සභාපතිවරයා විදියට ඔබට පුළුවන් මේ පන්සල රැක ගන්න.මේ පන්සල කන්දක් මුදුනක තමයි තියෙන්නේ. පොඩි හාමුදුරු නමක් තමයි පවත්ගෙන යන්නේ.ඒ දහම් පාසලෙත් විශාල දරුවන් ප්‍රමාණයක් අධ්‍යාපනය ලබනවා. ඒ නිසා මේ විහාරස්ථානය රැක ගැනීම සඳහා ඔබතුමාගේ වහාම මැදිහත් වෙන්න. ඒ වගේම සභාපතිතුමා අපේ මන්ත්‍රීවරු දීමනාව ගන්න කවුන්ටරේ ළඟ පෝලිමේ ඉන්නවා. අපිට ඉස්සර නම් සභාවටම ගෙනල්ලා දීමනාව බෙදුවා. ජනවාරි මාසෙ ඉඳන්වත් අපිට දීමනාව සභාවට ගෙනල්ලා ලබා දෙන්න කටයුතු කරන්න පුළුවන් නම් හොඳයි කියලා ඉල්ලනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.අසෝක්කුමාර් මැතිතුමා</u>**

ගරු සභාපතිතුමාගෙන්, ලේකම්තුමියගෙන් සහ ගරු මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි. සභාපතිතුමා යකහළුතැන්නට යන පාර ඉතාමත් අබල්නව පවතිනවා. ඒ ප්‍රදේශයේ අය ඒක වීඩියෝ කරලා තියෙනවා.නමුත් වීඩියෝ එක ගෲප් එකට දාන්න විදියක් නැහැ. ඒ නිසා මම ඒ අයට කිව්වා ලියුමක් හදලා ගරු සභාපතිතුමාට යොමු කරන්න කියලා. ඒ අනුව ඉතා අබලන් තත්ත්වයේ තියෙන නිසා කිරිමැටිතැන්න යකහළුතැන්න මාර්ගය ඔබතුමාට පොඩ්ඩක් ගිහිල්ලා බලන්න කියලා මම ඉල්ලා සිටිනවා. දීමනාව ගැන ගරු ස්වාමින් වහන්සේ කියපු නිසා ඒ ගැන කතා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ.අනික පහුගිය දවස්වල අපි සෞඛ්‍ය ශ්‍රමදාන කළා. විශේෂයෙන්ම මම ස්තුතිවන්ත වෙනවා තුෂාර මන්ත්‍රීතුමාටත් , කුමාර මන්ත්‍රීතුමාටත් ,අපේ වෙලේකුඹුර විශේෂ සෞඛ්‍ය සේවාවක් ඉටු කළා. අපි මන්ත්‍රීතුමන්ලා එකමුතු වෙලා මේ විදියට තමයි හැමදෙයක්ම සිදු කරන්න ඕනි කියලා මගේ ඉල්ලීම තියෙනවා. ඒ වගේම පහුගිය දවස්වල නායයාමේ අවදානමට ලක්වුණු පිරිසක් පෙට්ටිගල දමිළ විදුහලේ පවුල් 31යි , සිංහල විදුහලේ සිංහල පවුල් 08ක් හිටියා. ඒ සම්බන්ධව චින්තක මන්ත්‍රීතුමා පැය 24ම වගේ එම ප්‍රදේශයේ සේවය කළා. මමත් ඒ ටික නිරීක්ෂණය කරලා අවශ්‍ය උදව් උපකාර කළා. අවුරුදු 05න් පහළ ළමුන්ට අවශ්‍ය ඇඳුම් පැළඳුම් පවා මගේ පෞද්ගලික මුදලින් ලබා දුන්නා. ඒ වගේම කිරිමැටිතැන්න ලංකාභරණවත්තේ පවුල් 02ක් 03ක් ජලයෙන් යට වුණා. ඒක අර කාණුව පිරීම නිසා වුණ දෙයක් . උදේ වෙකොට ඒක හරි ගියා. ඒ අයටත් කියලා තියෙනවා ගරු සභාපතිතුමාට ඒ සම්බන්ධව අවධානය යොමු කරවලා සහනාධාර ලබා ගන්න කියලා. ඒ අතර මම ගරු සභාපතිතුමාට විශේෂයෙන් ස්තුතිය පුද කර සිටිනවා. ඒ වගේම මේකේ හිටපු සභාපතිවරුන් වන රත්නසිරි මැතිතුමාත්, මාවෙල සුනිල් මැතිතුමාත් , ඒ වගේම මම හොඳට දන්න

හඳුනන සභාපතිතුමාලා ඉන්න කාලේ, මේ ගොඩනැගිලි සාදා ගැනීමට මේ වගේ නෙවෙයි තිබුණු ඒ කාලේ, ඒ අයට පුළුවන් පුළුවන් විදියට මේක ඉතා දියුණු තත්ත්වයකට ගෙනාවා. ඒ වගේම ඉනිමගෙන් ඡන්දේ ඉල්ලපු නිහාල් විජයානන්ද මැතිතුමාත් අමතක කරන්න බැහැ. එතුමාත් මගේ හොඳ මිත්‍රයෙක්. එතුමත් මේ ප්‍රාදේශීය සභාව වෙනුවෙන් සැහෙන්න ඇප කැප වුණු ඒ මන්ත්‍රීවරයා, උපසභාපතිතුමාටත් ස්තුතිවන්ත වෙන්න ඕනි. ඒ වගේම විජයකුමාරන් කියලා උපසභාපති කෙනෙක් හිටියා. විපක්ෂ නායකවරයෙක් . එතුමාත් මේ ගොඩනැගිලි හදන්න සැහෙන්න කටයුතු කළා. මම ඔවුන් එක්කත් ඉතාම කිට්ටු සබඳතාවයක් තිබුණා. අපි වැඩ කළා . ඒ වගේම නවතම පත්වෙලා ඉන්න අපේ ආරියදාස ගමඇතිගේ මේ ගරු සභාපතිතුමා අපේ සභාව හදන්න කතා වෙනකොට මම හිතුවේ කාලයක් ගනියි කියලා. අපේ මේ මන්ත්‍රීවරුන්ට හදන මේ සභාව ඉතා කෙටි කාලයකින් මේක පළාත් ආණ්ඩුකාරතුමිය , ඒ වගේම පළාත් කොමසාරිස්තුමන්ලාත් සම්බන්ධ වෙලා අපට ඉතා විශාල ඒ වගේම ලස්සන පුංචි පාර්ලිමේන්තුව හදා ගන්නට මුල් තැබීමේ උත්සවයට අපි සියළු දෙනාටම ආරාධනා කළා. ඉතින් ඒ වෙනුවෙන් මහන්සි වුණාට අපේ ගරු සභාපතිතුමාට විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා. මොකද අපිට වාඩිවෙන්න මේසයක් පුටුවක් තිබුණට අපේ සහෝදර මන්ත්‍රීවරුන්ට පොතක් තියාගන්නවත් මේසයක් නැහැ. ඒ නිසා අපි මේ ප්‍රාදේශීය සභාව මීට වඩා හොඳ තැනකට ගේනන ඕනි. අපි ගම හදලා තමයි රට හදන්න ඕනි. ඒ වගේම මේ ගම හදන්න පත් කරලා ඉන්න නියෝජිතවරුන් සුවපහසුවට හිටියොත් තමයි ඔළුව හොඳට වැඩ කරන්නේ. ඉතින් මේ ගත්තු කඩිනම් පියවරට මාගේ විශේෂ ස්තුතිය පුද කරන අතර අනාගතයේ ඔබතුමාට පළාත් සභාවේ මහ ඇමති වෙන්න වාසනාව ලැබේවා කියලා ප්‍රාර්ථනා කරනවා. ඒ වගේම මම කියනවා ඊළඟ සභා වාරවල්වලදී ආගමික වතාවත් සිදු කරලා පටන් ගන්න පුළුවන් නම් හොඳයි කියලා. ඒ වගේම අපේ නිල නොලත් විපක්ෂ නායක ක්‍රිස්ටි මැතිතුමා කියනවා සියළුම මන්ත්‍රීවරුන්ට සම්බන්ධීකරණ කමිටු සඳහා අවස්ථාව ලබා දෙන්න පුළුවන් නම් හොඳයි කියලා.

- ❖ ගරු උපසභාපති බී.එල්.ඒ.ධනුෂ්ක නන්දසිරි මැතිතුමා පෙ.ව.11.40ට මාසික මහා සභා රැස්වීම සඳහා පැමිණෙන ලදී.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම්.ආර්.මලිත් ජයසේන මැතිතුමා</u>

සියළු දෙනාගෙන්ම අවසරයි. දිට්වා සුළි කුණාටුව නිසා ජීවිත අහිමි වූ, දේපළ අහිමි වූ ඒ වගේම සෑම අතින්ම විනාශයට පත් වූ සියළු දෙනා වෙනුවෙන්ම මා නියෝජනය කරන සමගි ජන බලවේගයේ අපේ ගරු විපක්ෂ නායකතුමා ඇතුළු සියළු දෙනාගේම බලවත් ශෝකය පළ කර සිටිනවා. ඒ වගේම අපේ උපසභාපතිතුමා මේ අවස්ථාවේ මෙතනට ආපු එක හොඳයි. ගිය සභාවරයට මෙතුමා මෙතනට එනකොට ඉතාම සුදු මුහුණක් තිබුණේ. අද මුහුණ පේන්නේ නැති තරමට කළු වෙලා. අපි අන්තර්ජාලයෙන් දැක්කා සැහෙන්න විශාල මහන්සියක් මෙතුමා ගත්තා ඔබතුමාගේ කණ්ඩායම අරගෙන ගිහිල්ලා බදුල්ලට බදුලු ශ්‍රම සේතුව කරනවා. අපි දැක්කා ඔබතුමාගේ කැපවීම. ඉතාම අගය කරන්න ඕනි. අපි කුහක නැහැ. ඒක නිසා අපි ඒක විවෘතව ප්‍රකාශ කරනවා.එවැනි දේවල් තමයි අපි බලාපොරොත්තු වෙන්න ඕනි අපිට පක්ෂ භේද වැඩක් නැහැ. ඔබතුමාට පක්ෂෙන් පවරපු ඒ රාජකාරිය අකුරටම ඉටු කරලා තමයි ඔබතුමා අද මෙතනට ආවේ. ඒ ගැන ඔබතුමාට අපේ ස්තුතිය පුද කර සිටිනවා. ඒ වගේම අපේ ප්‍රීතිකා මන්ත්‍රීතුමිය,ගීතානි මන්ත්‍රීතුමිය, අපේ අලංකාර මන්ත්‍රීතුමා විශාල වෙහෙසක් අරන් බදුල්ල ප්‍රදේශයට බඩු භාහිරාදිය අරගෙන ගියා . අපිට යන්න බැරි වුණත් මේ සියළු දෙනාම පුළුවන් උපරිමයෙන් උදව් කළා. ඉතින් ඒ ව්‍යවසනයට ලක්වුණු සියළු දෙනාටම උදව් කරන්න වෙහෙස වුණු ජනතාවට අපි ස්තුතිවන්ත වෙනවා. ඔබතුමාත් සැහෙන්න රාජකාරියක් කළා. ඒ වගේම මෙවන් ව්‍යසන වලදී ඔබතුමාට උපරිමයෙන්ම තමන්ගේ රාජකාරිය කරන්න ධෛර්යය ශක්තිය ලැබේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා. ඒ වගේම අල්ලස් දූෂණ කොමිෂන් එකෙන් තිබ්බ ඒ වැඩසටහන අපි සම්බන්ධ වුණා. ඉතින් රජය ඒ වගේ වැඩසටහනකට විශාල වියදමක් දරලා තමයි අපි වෙනුවෙන් ඒවා පවත්වන්නේ. අපි විශාල දැනුමක් අපිට ඒ තුළින් ලැබෙනවා. ඉතින් එවැනි අවස්ථා වලට කොහොමහරි සම්බන්ධ වෙන්න කියලා මම හැමෝගෙන්ම ඉල්ලා සිටිනවා. අනිත් එක තමයි අපි ගොඩක් බලාපොරොත්තුවෙන් හිටපු සභා ගොඩනැගිල්ල. කවදා හැදෙයිද කියලා හිතුවා. නමුත් ඔබතුමාගේ කාර්යශූරත්වය සහ දක්ෂතාවය නිසා ගරු ආණ්ඩුකාරතුමා සහ පළාත් පාලන කොමසාරිස්තුමා සමග කොහොම හරි සටන් කරලා මුදල් ප්‍රතිපාදන වෙන් කරගෙන ඔබතුමා ඒ සම්පත අපට ලබා දුන්නා. අපිත් ඒ මුලගල තියන උත්සවයට ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය

සමග සම්බන්ධ වුණා. ඉතින් මම හිතනවා නොබෝ දිනකදීම අපිට අළුත් සභා ගර්භයේ සභාව තියන්න පුළුවන් වෙයි කියලා. ඒ වගේම සිංහල අවුරුද්දට කලින් අපිට ඒ දේ කර ගන්න ධෛර්යය ශක්තිය ලැබේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.බී.ගුණරත්න මැතිතුමා</u>**

ගරු සභාපතිතුමා ඇතුළු සියළුම මන්ත්‍රීතුමන්ලාගෙන් සහ මන්ත්‍රීතුමියන්ලාගෙන් ද ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ලයෙන්ද අවසරයි. ඉතින් සභාව පිහිටවලා මාස 08ක් වගේ කෙටි කාලයකදී බළන්ගොඩ ප්‍රාදේශීය සභාව තුළ ඉතා විශාල වැඩ කොටසක් කළා. මං හිතන්නේ කෝටි ගණනාවක වැඩ ටිකක් කළා. මට මතකයි ඒ වැඩ කරන අතරේ ජනාධිපතිතුමා කියලා තිබුණේ ඉදිකිරීම් කිසිවක් කරන්න එපා කියලා.එහෙම වුණත් ඒකට පිටින් ගිහිල්ලා අපේ පරිපාලන ගොනැගිල්ල, එහෙම නැත්තම් සභා ගොඩනැගිල්ල හදන්න පුළුවන් කම ලැබුණේ, ඒ සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් කර ගන්න පුළුවන්කම ලැබුණේ අපේ ගරු සභාපතිතුමාගේ පූර්ණ මැදිහත් වීම නිසා. ඒකට එතුමාටත් මම විශේෂ ස්තුතියක් කරන්න ඕනි. ඒ වගේම ගරු මන්ත්‍රීවරුනි, අපි දන්නවා මේ දවස්වල මේ වැඩ කටයුතු කරනකොට මේ මුදල් ආපසු යන්න දෙන්නේ නැතිව මේ වර්ෂයට වෙන් කරපු මුදල් මේ වර්ෂය තුළම අවසන් කරන්න කියලා දැනුම් දීලා තියෙනවා. මට මතකයි මේ නිළධාරි මහත්වරු සහ මහත්මීන් සූම් මීටින්වලට සම්බන්ධ වුණා පළාත් සභාවෙන් කරපු . ඒ අයට දැඩිව බලපෑම් කළා මේ සල්ලි ආපහු යන්න දෙන්න එපා කියලා. ඇත්තටම මං හිතන්නේ ඒගොල්ලෝ රෑ දවල් නැතිව, නිවාඩු ගන්නේ නැතිව, නිවාඩු ගැන හිතන්නේ නැතිව, තමන්ගේ සුව පහසුව ගැන හිතන්නේ නැතිව, මේ කාලය තුළ වැඩ කළා. ඒක නිසා මේ කාලය තුළ මෙච්චර වැඩ කොටසක් කරන්න පුළුවන්කම ලැබුණේ ලේකම්තුමිය ඇතුළු ඒ නිළධාරින්ගේ අප්‍රතිහත ධෛර්යය නිසා. ඉතින් සභාවක් විදියට ඒ සියළු දෙනා වෙනුවෙන්ම මම මගේ ස්තුතිය පුද කර සිටිනවා. ඒත් එක්කම මම මතක් කරන්න ඕනි මගේ අදහසක් විදියට මේ වර්ෂය තුළ මේ මාස 07, 08 තුළ අපි විශාල වැඩ කොටසක් කළා. මං හිතන්නේ අපේ ගරු රණවන මන්ත්‍රීතුමත්, මමත් ඉන්න වසම ඇරුනම අනිත් වසම් 52 ම විශාල මුදලක් වියදම් කරලා , විශාල වැඩ කොටසක් කරලා තියෙනවා. ඉතින් මං හිතන්නේ ඒ කරපු වැඩ කොටස ගැන අපි කාටවත් අවබෝධයක් නැහැ සමස්තයක් විදියට. ඉතින් මේක ප්‍රායෝගිකව කරන්නේ කොහොමද කියලා මට අවබෝධයක් නැහැ, හැබැයි මම අදහසක් ඉදිරිපත් කරනවා අපිට වර්ෂය අවසානයේදී අපේ සභාව මැදිහත් වෙලා සභාවේ මුලිකත්වයෙන් කරන වැඩ කටයුතු පිළිබඳ අපට යම් කිසි සමාලෝචනයක් දෙන්න පුළුවන් නම් හොඳයි කියලා. මොකද අපිට ගමට ගිහිල්ලා කියන්න , අපෙන් අහන අයට කියන්න අපි මොනවද කළේ කියලා යම් කිසි දත්තයක් අපි සතුව තියෙනවනම් හොඳ නිසා. මේ පැවති අයහපත් තත්ත්වය තුළ අදාළ කටයුතු ඉක්මනින්ම අවසන් කරන්න මැදිහත් වුණු නිළධාරි මණ්ඩලයට, අපේ සහෝදර මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලාට මාගේ ගෞරවය පුද කරනවා. ස්තුතියි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඩබ්.තුෂාර කුමාර මැතිතුමා</u>**

සුභ දවසක් වේවා සියළු දෙනාටම. ගරු සභාපතිතුමා, උපසභාපතිතුමා, ඇතුළු පක්ෂ විපක්ෂ සියළුම මන්ත්‍රීතුමන්ලා සහ තුමියන්ලාගෙන් අවසරයි. මම අදහස් දැක්වීමට බලාපොරොත්තු වෙන්නේ හදිසි ආපදා තත්ත්වය සම්බන්ධව.ඉතින් පසුගියදා ඇති වූ ආපදා තත්ත්වයෙන් අපට විශාල ජීවිත ප්‍රමාණයක් අහිමි වුණා. ඒ වගේම විශාල දේපළ ප්‍රමාණයක් විනාශ වුණා. ඒ අය වෙනුවෙන් මම මුලින්ම මගේ ශෝකය ප්‍රකාශය කරනවා. ඒ වගේම බළන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ගත්තොත් අපේ එගොඩ වලේබොඩ කොට්ඨාශයේ හදිසි ආපදා තත්ත්වයක් ඇති වුණා. ඉතින් ඒ ප්‍රදේශයේ ජනතාව වලේබොඩ විද්‍යාලය වෙත යොමු කළා. ඉතින් දැන් ලොකු ගැටලුවක් නැහැ. NBRO එකෙන් ඇවිල්ලා එතන නිරීක්ෂණය කළා. දැන් ඒ වාර්තාව ලැබෙන්න තමයි තියෙන්නේ. ඉතින් දැන් ඉදිරියේදී පාසල පටන් ගන්න නිසා අපි ආරක්ෂිතව ඔවුන් ඥාති නිවාස වෙත යොමු කරලා තියෙනවා. ඒ වගේම එගොඩ වලේබොඩ සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි කාර්යාලයේත් මේ ආපදා තත්ත්වය නිසා පොඩි ඉරි තැලීමක් දකින්න ලැබුණා. ඉතින් අපි ඒ පිළිබඳවත් අවධානය යොමු කරලා සෞඛ්‍ය මධ්‍යස්ථානය එතන තියෙන ප්‍රජා ශාලාවක් වෙතට අරන් ගියා.ඉතින් අපි මේ ආපදා තත්ත්වය සැලවුණු වහාම ඔවුන්ට අවශ්‍ය පහසුකම් පිළිබඳ සොයා බලා ලබා දුන්නා. අපේ අලංකාර මැතිතුමාත් විශාල සේවයක් ලබා දුන්නා. ඉතින් මම කියන්න කැමතියි අපි බදුලු ශ්‍රම සේතුව කියලා ව්‍යාපෘතියක් ආරම්භ කළා ගිය සතියේ.ඒකට අපේ උපසභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරු විශාල ප්‍රමාණයක් සහභාගි වුණා. ඉතින් අපි දින 07ක් පුරා ඒ ප්‍රදේශයේ පාරවල්, ගෙවල් සුද්ධ කරලා ඔවුන්ට ඉන්න පුළුවන් මට්ටමට ඒවා පිළිසකර

කරලා දුන්නා. ඉතින් අපේ සහෝදරවරු නොදන්නා, ගෙයක් නොදන්නා පාරක් සුද්ධ කරමින් ඔවුන්ට සහයෝගය ලබා දුන්නා. ඉතින් ඒ සහෝදරවරු මේ වෙලාවෙත් ඒ පොදු ජනතාව වෙනුවෙන් විශාල කැප කිරීමක් කරනවා. මම ඒ අය වෙනුවෙන් මේ මොහොතේ ස්තුතිවන්ත වෙනවා. ඒ වගේම මම ඉතින් අපි පොහොසත් රටක් ගොඩනගන්න නම් අපේ භෞතික සම්පත්, ආර්ථිකය, සෞඛ්‍ය , දේශපාලන කියන මේ හැමදෙයකින්ම අපි පොහොසත් වෙන්න ඕනි. ඒ තුළින් තමයි අපේ රටේ මිනිසුන්ට අපිට ලස්සන ජීවිතයක් ලබා දෙන්න පුළුවන් වෙන්නේ. ඉතින් ඒ සඳහා පක්ෂ විපක්ෂ භේදයකින් තොරව අපි සියළු දෙනාම එකතු වෙලා කටයුතු කරමු මම හැමෝගෙන්ම ඉල්ලා සිටිනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.කේ.ඩබ්.ජගත් නිලන්ත කුමාර මැතිතුමා</u>**

ගරු සභාපතිතුමනි, අපේ ධනුෂ්ක මන්ත්‍රීතුමා කතා කළා වගේම මැදබැද්ද කොට්ඨාශයේ නෙළුයාය ග්‍රාම සේවා වසමේ ගල්ටැම්යාය කියන ගමේ මීට වසර 02,03ට පමණ ඉහතදී ඒ ගමේ සියළු දෙනාම එකතු වෙලා ඒ ගමට අවශ්‍යම වෙලා තිබුණු පන්සලක් ඉදිකර ගැනිමට කටයුතු කරලා තිබුණා.එහිදි ගැටලුකාරී තත්ත්වයක් ඇති වුණා. මොකද වන සංරක්ෂණ දෙපාර්තමේනන්තුවට අයත් ඉඩමක තමයි ඒ පන්සල් භූමිය ඉදි කරන්න කටයුතු කරලා තිබුණේ.ඉතින් ඒ ආයතන සමග ඇති වුණු ගැටලුකාරි තත්ත්වය නීත්‍යානුකූලව විසඳා ගැනිමට උසාවියට යොමු කළා. අද ඒ නඩුවේ අවසාන තීන්දුව බළන්ගොඩ උසාවියේදී ලබා දෙන්න නියමිත බව දැන ගන්න ලැබුණා. විශේෂයෙන්ම කියන්න ඕනි ඊයේ දිනයේ දායක සභාව රැස්වුණා කියලා ධනුෂ්ක මන්ත්‍රීතුමා කිව්වා ඇත්තටම මම දායක සභාවේ සාමාජිකයෙක් නොවන නිසාත්, එහිදී ආරාධනාවක් නොකරපු නිසාත් මට එතනට යන්න අවස්ථාවක් වුණේ නැහැ. ඒ ගැනත් කණගාටුව ප්‍රකාශ කරනවා. නමුත් රජයක් මේ ගැටලුව පිළිබඳ වසන්ත පුෂ්පකුමාර සහෝරයාත් එක්කත් කතා කරලා , එතුමාගේ පෞද්ගලික ලේකම් නීතිඥ පාලිත ජයසිංහ මහතා එක්කත් කතා කරලා නීතිමය උපදෙස් ලබා ගත්තා. මං හිතන්නේ ගරු මන්ත්‍රීතුමත් දන්නවා ඇති අලුතින් ඉදි කිරීම් කරන්න එපා කියලා තමයි ඒ තීන්දුව ලබා දෙන්න බලාපොරොත්තු වෙන්නේ.මේ වනතෙක් කඩා ඉවත් කරන්න කියලා නීතිමය බාධාවක් ඇවිල්ලා නැහැ. එතකොට මේක ගමේ කටයුතු කරගෙන යාමේදී අවශ්‍ය වන පන්සලක්. එතකොට මං මේ සඳහා මැදිහත් වෙලා කටයුතු කළා. ඒ පිළිබඳව ගම්වාසීනුත් දන්නවා. ඒ අනුව අපේ නව රජයේ ප්‍රතිපත්තිය අනුව උසාවියෙන් ලබා දෙන තීන්දු වලට දේශපාලන මැදිහත්වීම් කරන්නේ නැහැ. තීන්දුව කෙසේ වෙතත් ඒ අදාළ ආයතනය සමග කතා කරලා ඒ පන්සලට ගම්වාසීන්ට නිදහස් කරගන්න අවශ්‍ය කටයුතු කරන බව මේ අවස්ථාවේ ප්‍රකාශ කර සිටිනවා. ඒ වගේම මම මේක අවස්ථාවක් කර ගන්නවා පසුගිය දින වලදී අපේ රටේ ඇති වූ ආපදා තත්ත්වයෙන් හානියට පත් වූ ජනතාව වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කරන්න.ඒ වගේම ධනුෂ්ක සහෝදරයාත් මමත් දෙන්නම එකතු වෙලා ආධාර එකතු කරලා ආපදාවලට ලක්වුණු ජනතාවට බෙදා දීමට අවශ්‍ය කටයුතු සිදු කළා. මගේ කොට්ඨාශය වගේම සභාවට අයත් අනෙක් වසම් වල අයත් එකතු වෙලා මේ අපාදාවට ලක්වුණු ජනතාවට උදව් උපකාර කළා. ඒ වෙනුවෙන් මම සියළු දෙනාටම ස්තුතිවන්ත වෙමින් මගේ කතාව අවසන් කරනවා ස්තුතියි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.සමන් කුමාර මැතිතුමා</u>**

අපි 12 වෙනිදා ආපහු ශ්‍රම සේතුවට යනවා. පක්ෂ විපක්ෂ සියලු දෙනාටම ආරාධනා කරනවා අපිත් එක්ක සම්බන්ධ වෙන්න කියලා.

- ප.ව.12.00ට සභාවේ කටයුතු අවසන් කරනලදී.

ගමඇතිගේ ආරියදාස<br>සභාපති<br>බළන්ගොඩ ප්‍රාදේශීය සභාව